# Abstract No 75

## සිංහල ගැමිනාට්‍ය හා සංස්කෘත නාට්‍ය සම්ප්‍රදාය පිළිබඳ සංසන්දනාත්මක විමසුමක්

**ඒ. සෙව්වන්දි මනෝරත්න**
සිංහල විශේෂවේදී තෙවන වසර, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
sewwandimanorathna@gmail.com

සිංහල ජනජීවිතය පිළිබිඹු කරන කැටපතක් ලෙස ජනශ්‍රැතිය ඉදිරිපත් කළ හැකි ය. ඒ අනුව අතීත සිංහල ජනයාගේ සමාජ, දේශපාලන, ආර්ථික හා ඓතිහාසික තොරතුරු පිළිබඳ විවරණය වන ජනශ්‍රැති අංගයක් වශයෙන් සිංහල ගැමිනාට්‍ය සඳහා ප්‍රධාන තැනක් හිමි වේ. ඉන්දියාව නිජබිම කරගත් සංස්කෘත නාට්‍යසම්ප්‍රදාය සර්වකාලීන ප්‍රේක්ෂක ජනාදරයට පාත්‍ර වූ සුවිශේෂ කලාංගයක් වූ අතර දොළොස්වන සියවස වන විට අභාවයට පත්විණැයි සැලකෙන මෙම නාට්‍යකලාව පිළිබඳ හැදෑරීමට වර්තමානයේ මහෝපකාරී වන්නේ නාට්‍ය පිටපත් සහ ඒ පිළිබඳ ව සාකච්ඡා කළ විචාරකෘති ය. එම කෘතීන් ඇසුරු කර ගනිමින් සිංහල ජනශ්‍රැතිය කෙරෙහි සංස්කෘතයෙහි බලපෑම පිළිබඳ විමසීමේ දී, සිංහල ගැමිනාට්‍ය සඳහා විධිමත් සෛද්ධාන්තික පදනමක් මත ගොඩනැගුණු සංස්කෘත නාට්‍යකලාවේ ආභාසය ලැබී තිබේ ද යන්න විමසීම මෙම පර්යේෂණයෙහි අරමුණ වූ අතර මෙහි දී මූලික අවධානය යොමුවූයේ ගැමිනාට්‍යවල චරිත, වස්ත්‍රාභරණ හා වේදිකාව යන අංග කෙරෙහි සංස්කෘත නාට්‍යවල බලපෑම විමසීමට ය. සංස්කෘත නාට්‍ය පිළිබඳ ව ලියැවුණු විචාර කෘති හා නාට්‍ය පිටපත් මෙන් ම සිංහල ගැමිනාට්‍ය පිළිබඳ ව ලියැවුණු විචාර කෘති ද, සිංහල නාඩගම් සම්ප්‍රදාය ද මූලාශ්‍රය කර ගනිමින් සිදු කළ මෙම අධ්‍යයනයේ දී, ඉහත අංග එකිනෙක විශ්ලේෂණය කිරීමෙන් සිංහල ගැමිනාට්‍ය හා සංස්කෘත නාට්‍ය අතර සමවිෂමතා රැසක් හඳුනාගැනීමට ලැබුණි. ඒ ඇසුරින් විදග්ධ සංස්කෘත නාට්‍ය රචකයන් අතින් බිහි වූ සංස්කෘත නාට්‍යවල ආභාසය සිංහල ගැමිනාට්‍ය කෙරෙන් විද්‍යමාන වනවා සේ ම ඇතැම් අවස්ථාවල දී අසමානතා ලක්ෂණ ද දක්නට ලැබෙන බව ප්‍රත්‍යක්ෂ විය.

**ප්‍රමුඛපද :** ජනශ්‍රැතිය, චරිත, වස්ත්‍රාභරණ, වේදිකාව, සමවිෂමතා